අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2004 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2004

ඉතිහාසය I කොටස
History Part I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා**

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග' **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

01. (1) තිඹිරිවැව ගිරි ලිපිය (2) හබැස්ස ගිරි ලිපිය (3) තිරුවාලංගාඩු ලිපිය
(4) බදුල්ල ටැම් ලිපිය (5) සංගමු විහාර ලිපිය (..........)

02. (1) ජම්බුකෝළ පට්ටන (2) දොළොස් දහස් රට (3) අට දහස් රට
(4) පස්යොදුන් රට (5) දක්ඛිණ දේශ (..........)

03. (1) සිරිසවත්ථු පුර (2) අනුරාධගාම (3) විජිතගාම
(4) උපතිස්සගාම (5) උරුවෙලගාම (..........)

04. (1) ථූපාරාමය (2) ලංකාරාමය (3) මැදිරිගිරිය
(4) අම්බස්තල දාගැබ (5) රුවන්වැලි සෑය (..........)

05. (1) මහාතිත්ථ (2) මාතොට්ටම් (3) මහපුටු
(4) මල්වතු ඔය (5) මහාපට්ටන (..........)

06. (1) මුල්ලේරියාව (2) වෙල්ලස්ස (3) ගන්නොරුව
(4) රන්දෙනිවෙල (5) දන්තුරේ (..........)

07. (1) සේනා සම්මත වික්‍රමබාහු (2) ජයවීර බණ්ඩාර (3) කරල්ලියද්දේ බණ්ඩාර
(4) මායාදුන්නේ (5) සෙනරත් (..........)

08. (1) විලියම් කෝල්බෲක් (2) රොබට් බ්‍රවුන්රිග් (3) හෙන්රි වෝඩ්
(4) චාර්ල්ස් මැකාර්ති (5) විලියම් ග්‍රෙගරි (..........)

09. (1) දිඹුල (2) දික්ඔය (3) ගම්පොළ
(4) නාවලපිටිය (5) කල්පිටිය (..........)

10. (1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(3) රත්මලානේ ධම්මාලෝක හිමි (4) වළානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි
(5) මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි (..........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක අඩංගු වී ඇති, නම් **එකිනෙකට නො ගැළපේ.** එම **නො ගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට **අදාළ අංකය,** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

11. (1) මූල සික හා සිකවළඳ විනිස - භික්ෂූන් සඳහා වූ විවරණ නීතිමාලා එකතුවකි.
(2) දම්පියා අටුවා ගැටපදය - ධම්මපදට්ඨ කථාවට ලියන ලද විවරණයකි.
(3) පැරකුම්බා සිරිත - හයවන පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ වර්ණනයකි.
(4) සමන්තපාසාදිකා - විනය පිටකයට අටුවාවකි.
(5) සද්ධර්මරත්නාවලිය - ව්‍යාකරණ ග්‍රන්ථයකි. (..........)

12. (1) වන නදී - යෝධ වැව (2) කදම්බ නදී - මහකණදරා වැව
(3) ගෝණ නදී - කලාවැව (4) මහා නදී - පරාක්‍රම සමුද්‍රය
(5) ජජ්ජර නදී - මාගල්ල වැව (..........)

Past Papers Wiki

13. (1) අභයගිරි විහාරය - ජේතවන විහාරය
(2) අටදාගේ - හැටදාගේ
(3) නල්ලූර් කෝවිල - සමන් දේවාලය
(4) පද්මාවතී පිරිවෙන - විජයබා පිරිවෙන
(5) මල්වතු විහාරය - අස්ගිරි විහාරය (..........)

14. (1) යාපනයේ පෘතුගීසි පාලනය පිහිටුවීම - 1621
(2) පෘතුගීසීන් ලක්දිවට පැමිණීම - 1796
(3) කෝට්ටේ රාජ්‍යය පෘතුගීසි ආධිපත්‍යයට නතුවීම - 1597
(4) ලන්දේසින් යාපනය අත්පත් කර ගැනීම - 1658
(5) බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය අත්කර ගැනීම - 1815 (..........)

15. (1) ශ්‍රී ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා - ෆ්‍රෙඩ්රික් නෝර්ත්
(2) ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා - හෙන්රි මොන්ක් මේසන් මුවර්
(3) ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති - ඩී. ඇස්. සේනානායක
(4) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම සභාපති - ඒ. ඊ. ගුණසිංහ
(5) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති - පොන්නම්බලම් අරුණාචලම් (..........)

● අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශ / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශ / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට **ගැළපේ.** එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| X | | Y | |
|---|---|---|---|
| (i) | පදින්නෝරු වාපි | A | මින්නේරි වැව |
| (ii) | පත්තපාසාන වාපි | B | පදවිය වැව |
| (iii) | මණිහිරි වාපි | C | නාච්චදූව වැව |
| (iv) | තිලගුල්ලක වාපි | D | තලගල්ල වැව |
| (v) | මණ්ඩවාටක වාපි | E | මහමඩගල වැව |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (..........)

17.

| X | | Y | |
|---|---|---|---|
| (i) | රාජරාජ | A | චීන |
| (ii) | මාඝ | B | චෝළ |
| (iii) | චන්ද්‍රභානු | C | ජාවක |
| (iv) | ජටාවර්මන් | D | කාලිංග |
| (v) | චෙං-හෝ | E | පාණ්ඩ්‍ය |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (..........)

18.

| X | | Y | |
|---|---|---|---|
| (i) | දුටුගැමුණු රජු | A | රවිදේව |
| (ii) | වට්ටගාමණී රජු | B | ඵුස්සදේව |
| (iii) | ධාතුසේන රජු | C | කපිසීස |
| (iv) | පළමුවන විජයබාහු රජු | D | ලංකාපුර |
| (v) | පළමුවන පරාක්‍රමබාහු රජු | E | මිගාර |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (..........)

19.

| X | | Y | |
|---|---|---|---|
| (i) | රිඩ්ල් කොමිසම | A | සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම |
| (ii) | ඩොනමෝර් කොමිසම | B | විශ්ව විද්‍යාලය පිහිටුවීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම |
| (iii) | සෝල්බරි කොමිසම | C | රාජකාරි සේවාව අහෝසි කිරීම |
| (iv) | මෝර්ගන් කමිටුව | D | කැබිනට් ක්‍රමය හඳුන්වාදීම |
| (v) | කෝල්බෲක් කොමිසම | E | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (..........)

| | X | | Y |
|---|---|---|---|
| 20. (i) | කොට්ටල් බද්ද | A | පැදුරු වියන්නන්ගේ කාර්යාංශය |
| (ii) | කුරුවේ බද්ද | B | ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (iii) | මඩිගෙ බද්ද | C | ප්‍රවාහන සේවා කාර්යාංශය |
| (iv) | කින්නර බද්ද | D | කුරුඳු පිළිබඳ කාර්යාංශය |
| (v) | මහ බද්ද | E | අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |

(1) BCADE (2) BADEC (3) BECAD (4) BDCEA (5) BCEAD (...........)

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති A,B,C සහ D යන ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. **නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

A සහ B පමණක් නිවැරදි නම් ........................................ 1 ද,

B සහ C පමණක් නිවැරදි නම් ........................................ 2 ද,

C සහ D පමණක් නිවැරදි නම් ........................................ 3 ද,

A සහ C පමණක් නිවැරදි නම් ........................................ 4 ද,

ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි **නම්** ........... **5 ද, තිත් ඉර මත** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

21. ලක්දිව බුද්ධාගමේ විකාශනය සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) දේවානම්පිය තිස්ස රජුගේ පාලන සමයේ දී භික්ෂු-භික්ෂුණී ශාසන පිහිටුවීම.
(B) වට්ටගාමණී රජුගේ රාජ්‍ය කාලයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
(C) සිරිමෙවන් රජුගේ පාලන සමයේ දී දන්ත ධාතූන් වහන්සේ වැඩම කිරීම.
(D) මහා පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය සමයේ දී ත්‍රෛනිකාය සමගි කිරීම. (...........)

22. පළමුවන විජයබාහු රජුගේ කාර්ය සංසිද්ධීන් පිළිබඳ ව පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) චෝළ ආධිපත්‍යයෙන් ශ්‍රී ලංකාව නිදහස් කර ගැනීම.
(B) රජකම ලැබීමට පෙර ඔහු ගතකළ ජීවිතය පිළිබඳ ප්‍රුහුඬු විස්තරයක් පනාකඩු තඹ සන්නසෙහි සඳහන් වීම.
(C) තෝපාවැව ඉදි කිරීම.
(D) චීනය සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම. (...........)

23. ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම පිළිබඳ ව පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාව සහ පෘතුගාලය අතර සෘජු වෙළෙඳ සම්බන්ධතා පැවතීම.
(B) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව පිහිටීම නිසා දෙරට අතර වෙළෙඳ සම්බන්ධතාවලට මඟ පෑදීම.
(C) මහාතිත්ථ අනුරාධපුර යුගයේ දී ඉතා වැදගත් වරාය වීම.
(D) මහනුවර යුගයේ දී ශ්‍රී ලංකාවෙන් චීනයට රෙදිපිළි, අශ්වයින් සහ පිඟන් භාණ්ඩ නිර්යාත කිරීම. (...........)

24. පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) තෝම්බු සම්පාදනය කිරීම. (B) රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම.
(C) රෝමානු කතෝලික ආගම හඳුන්වා දීම. (D) වතු ආර්ථිකය තහවුරු වීම. (...........)

25. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් පහත දක්වෙන කවර ප්‍රකාශය ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) මහා මාර්ග සහ දුම්රිය මාර්ග ඉදිකිරීම වතු ආර්ථිකයේ ව්‍යාප්තියට තුඩුදුන් ප්‍රධාන සාධකයකි.
(B) එඩ්වර්ඩ් බාර්න්ස් ආණ්ඩුකාරවරයා විසින් කොළඹ - මහනුවර මාර්ගය ඉදිකරනු ලැබී ය.
(C) කොළඹ - මහනුවර දුම්රිය මාර්ගය ශ්‍රී ලංකාවේ ප්‍රථම දුම්රිය මාර්ගය විය.
(D) වතු ආර්ථිකයේ ව්‍යාප්තිය හා සමගාමී ව ඇති වූ ප්‍රවාහන වර්ධනය ශ්‍රී ලංකාවේ ආර්ථික විපර්යාසයේ වැදගත් ම සිදු වීමයි. (...........)

Past Papers Wiki

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත** ලියන්න.

26. පණ්ඩුකාභය රජුගේ පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර කාරණය නිවැරදි වේ ද?
    (1) අනුරාධපුරය ප්‍රථමවරට අගනුවර කර ගන්නා ලද්දේ පණ්ඩුකාභය රජු විසින් ය යනු පරම්පරාගත කථාවකි.
    (2) ඔහුගේ පාලන සමයේ දී දකුණු ඉන්දියාවෙන් ආක්‍රමණයක් එල්ල වීම.
    (3) දණ්ඩනයක් වශයෙන් ශාරීරික වධ බන්ධනය අවලංගු කරන නීතියක් ඔහු විසින් පනවනු ලැබීම.
    (4) පණ්ඩුකාභය රජු අසෝක අධිරාජයාගේ සමකාලීනයෙකු වීම.
    (5) මහමෙවුනා උයන පිහිටුවීම. (..........)

27. රාජ්‍ය පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීමේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද?
    (1) කුරුණෑගල, දඹදෙනිය, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
    (2) දඹදෙනිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
    (3) දඹදෙනිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ
    (4) දඹදෙනිය, ගම්පොළ, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ
    (5) දඹදෙනිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ (..........)

28. සීතාවක ඉදිකරන ලද හින්දු දේවාලය කුමක් ද?
    (1) තිරුකේතිශ්වරම් (2) මුන්නේශ්වරම් (3) කෝනේශ්වරම්
    (4) බෑරැන්ඩි (5) කන්දසාමි (..........)

29. රන්දෙනිවෙල සටනේ දී මියගිය පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා වූයේ,
    (1) ජෙරනිමෝ ද අසවේදු ය. (2) කොන්ස්තන්තිනෝ ද සා ද නොරොඤ්ඤා ය.
    (3) පෙඩ්රෝ ලෝපේස් ද සෞසා ය. (4) දියෝගු ද මෙලෝ ද කැස්ත්‍රෝ ය.
    (5) ජෝර්ජ් ද අල්මිදා ය. (..........)

30. 1840 මුඩු බිම් පනතේ ප්‍රධාන අරමුණු වූයේ,
    (1) වී වගාව දියුණු කිරීමයි.
    (2) ධාන්‍ය බද්ද අවලංගු කිරීමයි.
    (3) වැවිලිකරුවන්ට කැලෑ ඉඩම් විකිණීම නීත්‍යානුකූල කිරීමයි.
    (4) මාර්ග ආඥා පනත සංශෝධනය කිරීමයි.
    (5) වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමයි. (..........)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම කරුණ තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

31. **අනුරාධපුර රාජධානියේ පරිපාලන සංවිධානය**
    (1) රාජාණ්ඩු ක්‍රමයක් පැවතීම.
    (2) පැරණි නීතිරීති හා සංස්ථා ආරක්ෂා කිරීම රජුගෙන් බලාපොරොත්තු වීම.
    (3) මේ යුගයේ ප්‍රාදේශීය පාලනය පිළිබඳ නීති ගල්පොත සෙල් ලිපියේ දක්වා තිබීම.
    (4) පුරෝහිත, දොවාරික, සේනාපති ආදීහු මධ්‍යම පරිපාලනය සම්බන්ධ සමහර වැදගත් නිලධාරීන් වීම.
    (5) රජු සහ සංඝයා අතර අන්‍යෝන්‍ය සම්බන්ධය. (..........)

32. **සීගිරිය**
    (1) සීගිරියේ ඓතිහාසික යුගය ශ්‍රී ලංකාවට බුදු සමය හඳුන්වා දුන් අවධිය දක්වා දිවයයි.
    (2) සීගිරියේ ඇති ලෙන් ලිපිවලින් එම ලෙන්වල ආදි කාලයේ සිට ම භික්ෂූන් වැඩ සිටි බවට සාක්ෂි ලැබේ.
    (3) සීගිරියේ වඩාත් ම කැපී පෙනෙන නටබුන් වන්නේ එහි බිතුසිතුවම් ය.
    (4) සීගිරිය ධාතුසේන රජුගේ අගනුවර විය.
    (5) සීගිරියේ ජල උද්‍යානය අතීත උද්‍යාන අලංකාරකරණය පිළිබඳ මාහැඟි උදාහරණයකි. (..........)

33. **පෘතුගීසීන්ට මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීමෙහි ලා බලපෑ සාධක**
    (1) කැලිකට්හි සැමොරින්ගෙන් ලත් ආධාර
    (2) කෝට්ටේ රාජධානියේ දේශපාලන අස්ථාවරත්වය
    (3) සීතාවක රාජධානියේ ශීඝ්‍ර බිඳවැටීම
    (4) පෘතුගීසි නාවුක ආධිපත්‍යය
    (5) පෘතුගීසීන් සතුව පැවති ශක්තිමත් හමුදා සම්පත් (..........)

34. **මහනුවර රාජධානියේ බිඳවැටීම**

(1) රජු සහ රදළයන් අතර වූ ගැටුම් (2) ටොරිංටන් සාමිගේ පාලන ප්‍රතිපත්තියේ දුර්වලතා
(3) බ්‍රිතාන්‍යයන්ගේ උඩරට ආක්‍රමණ (4) රජුට ජනතා සහයෝගය හීන වී යෑම
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය (..........)

35. **දහනවවන සියවස අගභාගයේ දී ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය**

(1) බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම (2) විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් පිහිටුවීම
(3) යාපනයේ හින්දු විද්‍යාලය ආරම්භ කිරීම (4) මුස්ලිම් නෙයිෂන් පුවත්පත ආරම්භ කිරීම
(5) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම (..........)

- පහත දැක්වෙන අංක **36** සිට **40** තෙක් වූ ප්‍රශ්නවලට ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශය දැයි තෝරා **එම අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවෙනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදිය, පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | | දෙවෙනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | මිහිඳු මාහිමියන් සහ එම පිරිසේ තවත් තිදෙනෙකු පිළිබඳ ව ක්‍රි. ව. පළමුවන සියවසට පමණ අයත් මිහින්තලේ සෙල් ලිපියක සඳහන් වේ. | මේ අනුව "මිහිඳු මාහිමි ප්‍රධාන ධර්මදූත පිරිස විසින් ශ්‍රී ලංකාවේ බුදුසසුන පිහිටුවන ලද්දේ ය." යන වෘත්තාන්තය බුදුසසුන පිහිටුවනු ලැබූ කාලයට අවුරුදු 300 කට පමණ පසු ලියන ලද සෙල් ලිපියකින් තහවුරු වේ. | (..........) |
| 37. | පළමුවන රාජරාජ රජුගේ විරුද නාමයක් අනුව අනුරාධපුර ජනනාථ මංගලම් යනුවෙන් නම් කරන ලදී. | චෝළයන් විසින් මෙරට පාලනය කරන ලද ප්‍රදේශය මුම්මුඩි සෝල මණ්ඩලම් නමින් හැඳින්වේ. | (..........) |
| 38. | ලන්දේසිහු ශ්‍රී ලංකාවේ වෙළෙඳ ආධිපත්‍යය නතුකර ගැනීම සඳහා දිවයිනේ බොහෝ වරායවල්වල බලය පැතිර වූහ. | 1762 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම විසින් ශ්‍රී ලංකාවට එවන ලද ප්‍රථම දූතයා වූයේ ජෝන් පයිබස් ය. | (..........) |
| 39. | සෙනරත් රජු මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා ය. | නරේන්ද්‍රසිංහ රජු මහනුවර රාජධානියේ අවසාන පාලකයා ය. | (..........) |
| 40. | ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථාන අතුරෙන් එකක් වන්නේ ඩොනමෝර් ප්‍රතිසංස්කරණයි. | ඩොනමෝර් කොමසාරිස්වරු වර්ෂ 1947 දී ශ්‍රී ලංකාවට පැමිණියහ. | (..........) |

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2004 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2004

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

## II කොටස

01. අනුරාධපුර යුගය අවසානය දක්වා ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමෙහි ලා වංශකථාවලින් ලැබෙන තොරතුරු, අභිලේඛන හා අනෙකුත් මූලාශ්‍රයවලින් කෙතෙක් දුරට සනාථ වේ දැයි පරීක්ෂා කරන්න. **(ලකුණු 14 යි)**

02. දුට්ඨගාමිණී සහ වට්ටගාමිණී රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන්හි සමාන අසමානතා පහත දැක්වෙන මාතෘකා යටතේ විචාරාත්මක ව විමසන්න.
(i) ඔවුන් මුහුණ පෑ අභියෝග
(ii) දිවයින එක්සත් කිරීම **(ලකුණු 14 යි)**

03. පොළොන්නරු යුගය සහ පශ්චාත් පොළොන්නරු යුගය සම්බන්ධ පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.
(i) පොළොන්නරු යුගයේ වාරි මාර්ග ක්‍රමය
(ii) නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදුවූ අභියෝග
(iii) II වන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධීන්
(iv) පශ්චාත් පොළොන්නරු යුගයේ වෙළෙඳ හා වාණිජ කටයුතු **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

04. "හයවන පරාක්‍රමබාහු රජුගේ දීර්ඝ රාජ්‍ය සමය යුද්ධය මෙන් ම සාමය සම්බන්ධ කාර්ය සංසිද්ධීන් අතින් ශ්‍රී ලංකා ඉතිහාසයේ අවසාන කීර්තිමත් අවධිය විය." සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

05. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පැවති ලන්දේසි පාලන ක්‍රමය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
(i) ලන්දේසි පාලකයන්ගේ අරමුණු
(ii) මධ්‍යම පරිපාලන ව්‍යුහය
(iii) ප්‍රාදේශීය පාලනය **(ලකුණු 14 යි)**

06. මහනුවර රාජධානියේ සමාජ සහ ආර්ථික සංවිධානය පිළිබඳ ව රචනයක් ලියන්න. **(ලකුණු 14 යි)**

07. කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම හා පරිපාලන ප්‍රතිසංස්කරණ පහත දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
(i) ඒකාබද්ධ පරිපාලන ක්‍රමයක් ඇති කිරීම
(ii) ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

08. වතු ආර්ථිකයේ වර්ධනය නිසා ඇති වූ සමාජයීය හා ආර්ථික බලපෑම් පහත දැක්වෙන මාතෘකාවන්ගෙන් ඕනෑ ම මාතෘකා **දෙකක්** ආශ්‍රයෙන් විචාරාත්මක ව විග්‍රහ කරන්න.
(i) සංක්‍රමණික කම්කරුවෝ
(ii) ප්‍රවාහන කටයුතුවල වර්ධනය
(iii) ග්‍රාමීය කෘෂි ආර්ථිකය **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

PAST PAPERS WIKI

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම මාතෘකා **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.
(i) මල්වතු ඔය සහ මහවැලි ගඟ පැරණි ලක්දිව ආදි ජනාවාසවල ව්‍යාප්තිය කෙරෙහි වැදගත් වූ ආකාරය
(ii) මහසෙන් රජුගේ පාලන සමය අවසානය දක්වා වාරි මාර්ග ක්‍රමයේ වර්ධනය
(iii) අනුරාධපුර යුගයේ මූර්ති කලාව
(iv) සීතාවක රාජධානියේ පරිහානිය
(v) පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණය
(vi) 1818 'කැරැල්ල' **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කර, නම් කොට** ඒවායින් ඕනෑ ම ස්ථාන **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| (1) වලවේ ගඟ | (2) දඹකොළ පටුන | (3) කලාවැව | (4) අනුරාධපුර |
| (5) දකුණු පළාත | (6) ගම්පොළ | (7) මන්තාරම | (8) කෝට්ටේ |


**(නිවැරදි ව ලකුණු කිරීම හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි සටහනකට ලකුණු 05 බැගිනි)**

පැරණි ප්‍රශ්නපත්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය නොමිලේ බෙදාහැරීම පිණිස පමණි

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2004 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2004

ප්‍රශ්න අංකය 10 විභාග අංකය........................................................




PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library